පොතුවිල් ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
--------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 16 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-----------------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජ්/එස්එෆ්පීඑස්ජ්එස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තු රු. 11,500 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අපද්‍රව්‍ය එකතුකිරීම සඳහා මිලදී ගෙන තිබූ ප්ලාස්ටික් කුඩ 215 කින් ප්‍රයෝජනයට නොගත් කුඩ 177 ක වටිනාකම් රු. 290,634 වත්කම් ගිණුමට ගෙන නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශ සහ සැලසුම් කාර්යාල වලින් පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන 14 ක් සහ සභාවේ වාහන 15 ක වටිනාකම තක්සේරුකර වත්කම් ගිණුමට ගෙන නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ තිබූ විදුලි උපකරණ තොගවල වටිනාකම රු. 14,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ වත්කම් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

1.3.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්
---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු මහජන පොළ කඩ කාමර බදුගත් බදුකරුවන් 08 දෙනෙකුගෙන් 1995 වර්ෂය සිට 2005 වර්ෂය අවසානය දක්වා හිඟව තිබූ කඩ කාමර කුලී රු. 32,667 ක් අයකර ගැනීමට හෝ අදාල අයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට 2015 මාර්තු 23 වන දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයට පෙර ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 02 ගෙන් අයවියයුතු රු. 112,354 ක් සහ සේවය හැරගිය නිලධාරීන් 17 දෙනෙකුගෙන් අයවියයුතු රු. 435,700 ක මුදලද ස්ථාන මාරුවී ගිය ආයතනයෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 2015 මාර්තු 23 වන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 3,096,724 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 1,575,692 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,521,032 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 වරිපනම් බදු
-------------

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ පිහිටි ඉඩම්, ඉදි කරන ලද නිවාස සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් වරිපනම් බදු අයකිරීම් සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර වරිපනම්බදු අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 1992 සිට 2013 වර්ෂය අවසානය දක්වා හිඟව පවතින හිඟ මස්කඩ බදු රු. 1,718,703 ක් අයකර ගැනීමට හෝ අදාල පුද්ගලයින්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ක්‍රියාකර නොතිබුණි.

2.2.2 බලපත්‍ර ගාස්තු
---------------

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන වෙළඳ මධ්‍යස්ථාන, භෝජන ශාලා, තානායම් සහ සංචාරක ලැගුම්හල ඇතුළුව ස්ථාන 674 කින් වාර්ෂික බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 1,561,138 ක් අයකරගෙන තිබුණද ගාස්තු අයකරන ලද එම ස්ථාන වලින් ස්ථාන 450 කට වෙළඳ බලපත්‍ර විගණිත දිනය වන 2015 මාර්තු 23 දක්වා සභාවෙන් ලබා දී නොතිබුණි.

(ආ) වර්ග කි.මී. 232 ක ප්‍රමාණයෙ ප්‍රදේශයට ස්ථාපිත කර තිබූ ප්‍රචාරක දැක්වීම් බැනර් සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149, 150, 151 සහ 152 වගන්තියවලට අනුව අතුරු ව්‍යවස්ථා සකස්කර බලපත්‍ර ගාස්තු අයකිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබීමෙන් වාර්ෂිකව රු. 500,000 ක් පමණ ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

2.2.3 කඩ කාමර බදු ආදායම්
-----------------------

2013 සහ 2014 යන කාල පරිච්ඡේදයතුල සභාව සතු මහජන පොළ කඩ කාමර 65 ක් බදු ගෙන තිබූ බදුකරුවන් 28 දෙනෙකුගෙන් 2013 වර්ෂය අවසානය දක්වා අයවියයුතු හිඟ කඩ කාමර බදු රු. 446,882 ක් සහ 05 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයවියයුතු රු. 28,000 ක්ද 2015 මාර්තු 23 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කළමණාකරණ දුර්වලතා
--------------------------

(අ) කඩ කාමර 25 කින් සමන්විත පොතුවිල් මහජන පොළ වෙළඳ සංකීරණයේ කඩ කාමර 16 ක් 2011 වර්ෂයේ සිට විගණන පරික්ෂණ දිනය වන 2015 මාර්තු 23 වන දිනය දක්වා වසා තිබුනද, එම කඩකාමරවල විදුලි ගාස්තු රු. 184,320 ක් සභාව විසින් ගෙවා තිබුණි.

(ආ) සභාවේ ආදායම් තත්වය වැඩි කිරීම් සහ රැකියා අවස්ථා ඇතිකිරීමේ අරමුණෙන් 2008 සහ 2011 වර්ෂවල වර්ල්ඩ් විෂන් ආයතනයෙන් ලබා දුන් රු. 1,231,600 ක අරමුදල සහ සභා අරමුදලින් රු. 1,621,127 ක් යොදවා ඉදිකරන ලද යන්ත්‍ර සූත්‍ර සහිත කඩදාසි ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය සේවකයන්ට අවශ්‍ය නිසි පුහුණු ලබා නොදීම හේතුවෙන් වර්ෂ හතරකට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබූ අතර මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2015 මාර්තු 23 වන විගණන දිනය දක්වා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
--------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගත යුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 වන දින අංක 03 දරණ පළාත් පාලන ප්‍රතිසංස්කරනය පිළිබඳ චක්‍රලේඛයේ 8 වන ඡේදයෙන් පෙන්වාදී තිබූ පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5 පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ආදායම් පරිපාලනය